# මධ්‍යම පළාත් සභාව
# மத்திய மாகாண சபை
# CENTRAL PROVINCIAL COUNCIL

## මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන

මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන ,මිනිස් බල, ද්‍රවිඩ අධ්‍යාපන හා මුස්ලිම් පාසල් කටයුතු, සංස්කෘතික කටයුතු, ඉඩම්, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු, සංචාරක, ක්‍රීඩා සහ ආයෝජන සම්බන්ධීකරණ, වෙනත් අමාත්‍යාංශයන් යටතට නොගැනෙන විෂයයන් සම්බන්ධ අමාත්‍යාංශය

## மத்திய மாகாண பிரதான மற்றும் கல்வி

நிதியும் திட்டமிடலும், சட்டமும் ஒழுங்கும், உள்ளூராட்சி மற்றும் மாகாண நிர்வாகம், மனித வலு, தமிழ் கல்வி மற்றும் முஸ்லிம் பாடசாலை நடவடிக்கைகள், கலாசார விவகாரங்களும், காணி, வர்த்தகமும் வாணிபமும், உணவு விநியோகமும் பகிர்ந்தளிப்பும், சுற்றுலா, விளையாட்டு மற்றும், முதலீடு தொடர்பிணைப்பு, ஏனைய அமைச்சுக்களுக்கு கீழ் சேர்த்துக் கொள்ளப்படாத விடயங்கள் தொடர்பான அமைச்சு

## Central Provincial Chief And Education

Ministry of Finance and Planing, Law and order, Local Government and Provincial Administration, Man Power, Tamil Education and Muslim Schools Activities, Culture Affairs, Land, Trade and Commerce, Food Supplies and Distribution, Tourism, Sports and Investment Coordination Portfolios which are not taken under any other Ministries

පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ, කුණ්ඩසාලේ
மாகண சபைக் கட்டத் தொகுதி, பல்லேகலை, குண்டசாலை.
Provincial Council Complex, Pallekele, Kundasale.

විද්‍යුත් තැපැල /மின் அஞ்சல்/E-mail : pcmcentral@gmail.com | වෙබ් අඩවිය/இ.தளம்/ Website : www.cpcm.lk

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය<br>அமைச்சு அலுவலகம்<br>Ministry Office | 081-4481322 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2424938 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவி செயலாளர்<br>Senior Assistant Secretary | 081-2424936 | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | 081-2424935 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0812424938 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | සිපීසී/සීඑම්එස්/1/2/1/5-4 -අභ්‍යන්තර චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.03. 18 |

අභ්‍යන්තර චක්‍රලේඛ අංක : **CMS/PD/EDU/2024/1**

මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම විදුහල්පතිවරු
මධ්‍යම පළාත

**<u>මහජන දිනය වන සඳුදා දින ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණෙන ගුරුභවතුන් ඇතුළු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන නිලධාරීන් සඳහා වන මාර්ගෝපදේශ</u>**

විවිධ රාජකාරීමය අවශ්‍යතා සඳහා සෑම සතියකම මහජන දිනය එනම් සතියේ සඳුදා දින ගුරුභවතුන් ඇතුළු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාල නිලධාරීන් විශාල පිරිසක් මෙම අමාත්‍යාංශයට පැමිණෙන බැවින් ඔවුන්ගේ සේවා අවශ්‍යතාව ඉටුකිරීමට මාගේ සේවක මණ්ඩලය කොතෙක් යුහුසුළු වුවද, ඇතැම් අවස්ථාවලදී තම සේවාව ඉටුකරවා ගැනීමට බොහෝ වේලාවක් අප අමාත්‍යාංශයෙහි රැඳී සිටීමට ඔවුනට සිදුවන බව මවිසින් නිරීක්ෂණය කර ඇත. තවද මේ තුළින් සේවාලාභීන්ගේ වටිනා කාලය අපතේ යන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට මෙම අමාත්‍යාංශය තීරණය කර ඇත.

02. තවද විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් සිය පෞද්ගලික නිවාඩු ලබා ගනිමින් දුරබැහැර ප්‍රදේශවල සිට විශාල කාලයක් වැය කරමින් ද විශාල ප්‍රවාහන වියදමක් දරමින් ද මෙම අමාත්‍යාංශයට පැමිණීම ඔවුන්ගේ ආර්ථිකයට අයහපත් බලපෑමක් ඇතිකරනවා මෙන්ම පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලටද සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එම නිසා ඉහත තත්ත්වය මගහැරවීම සඳහා පහත වැඩපිළිවෙල ඔබ වෙත යෝජනා කරමි.

03. එසේ පැමිණෙන නිලධාරීන්ගේ අවශ්‍යතා අධ්‍යනය කිරීමේදී ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක් තමා අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය වෙතින් හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙතින් විසඳුම් ලබගත හැකි කරුණු බවද නිරීක්ෂණය කරමි. කලාපයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පොදු වෘත්තීමය කටයුතු වලදී එනම්,

- පත්වීම් ස්ථිර කිරීම
- උසස් කිරීම්
- මුදා හැරීම්
- විශ්‍රාම ගැන්වීම්
- සියලුම ආකාරයේ ස්ථාන මාරුවීම් (කලාපය තුළ/ කලාප අතර)
- සේවා අනුයුක්ත කිරීම්
- සියලුම නිවාඩු සම්බන්ධ කටයුතු
- වැටුප් විෂමතා හා අදාල කටයුතු

සම්බන්ධයෙන් මතුවන ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව තීරණ ලබාදීමට බලය අභිනියෝජිත බලධරයන් වශයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට හැකියාව පවතින බවද අවධාරණය කරමි. කලාපය තුළ ගුරු/ සංවර්ධන නිලධාරී/අනධ්‍යයන සේවක ස්ථාන මාරුවීම්, කලාප අතර ගුරු/ සංවර්ධන නිලධාරී/අනධ්‍යයන සේවක ස්ථාන මාරුවීම් සඳහා අවශ්‍ය බලතල මවිසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පවරාදී ඇති බවද සිහිපත් කරමි.

04. හැකිතාක් දුරට ගුරුභවතුන්ගේ කටයුතු කලාප කාර්යාල මඟින්ම ඉටුකර දීමට මෙම අමාත්‍යාංශයෙන් බලාපොරොත්තු වන අතර චලනයන් අවම කිරීම තුළින් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සේවාලාභීන් වෙත ලබාදීමේ අරමුණ පෙරදැරිව මෙම ක්‍රියාවලිය ආරම්භ කර ඇත. කලාප කාර්යාලයට හෝ කලාප අධ්‍යක්ෂවරයාට, පළාත් අධ්‍යක්ෂවරයාට විසඳිය නොහැකි ගැටළු හා ප්‍රතිපත්තිමය කාරණා සහ උපදෙස් සඳහා ගුරුභවතුන් මෙම අමාත්‍යාංශයට ඉන්පසු යොමු කළ හැක. එබැවින් මේ සමඟ යා කර ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නේ නම් මැනවි.

i. විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, සංවර්ධන නිලධාරීන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු ඉහත දක්වා ඇති කරුණක් සඳහා මෙම අමාත්‍යාංශයට පැමිණීමේදී එම කරුණ පහත නිලධාරීන්ට අදාල වන්නේ නම් ඔවුන්ගේ නිර්දේශ ආකෘති පත්‍රයෙහි සඳහන් කර ගැනීමෙන් පසු පැමිණිය යුතුය
- ✓ විදුහල්පතිවරයා
- ✓ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
- ✓ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ( අදාල වේ නම්)

04. එම ආකෘති පත්‍රය සම්පූර්ණ කර ගැනීමකින් තොරව මහජන දිනයේ සේවා සපයා ගැනීමට පැමිණෙන අය හට ප්‍රමුඛතාවයක් ලබාදීමට නොහැකි වන බව කාරුණිකව දැනුම් දෙන අතර ඔබ වෙත පවරා ඇති බලතලවලට අදාල කරුණු වෙනුවෙන් නිෂ්ඵලව සේවාලාභීන් අප අමාත්‍යාංශය වෙත පැමිණෙන බවක් නිරීක්ෂණය වුවහොත් ඒ පිළිබඳව ඔබගෙන් කරුණු විමසීමට සිදුවන බැවින් මේ පිළිබඳව සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් සියලුම විදුහල්පතිවරුන් දැනුම්වත් කරන ලෙස කාරුණිකව දන්වමි.

05. මෙම වැඩපිළිවෙළ මඟින් ඍජුවම මා සම්මුඛ වීමට මහජන දිනයේ ගුරුභවතුන්ට අවස්ථාව ලබාදීමේ බාධාවක් ඇති නොවේ. ඒ සඳහා ඕනෑම ගුරුභවතෙකුට අවස්ථාව ඇති අතර, හැකිතාක් දුරට මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම තුළින් බලය විමධ්‍යගත කිරීමෙන් සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අප ගත් ක්‍රියාමාර්ගය නැවත සමාලෝචනයකට භාජනය වනු ඇත. එමඟින් කලාප අධ්‍යාපන කාර්යාලවල කාර්යක්ෂමතාවය පිළිබඳවද මා හට අධ්‍යයනයක් සිදුකිරීමට හැකියාව ලැබේ. මේ අනුව මෙම ලිපියේ දින සිට මෙම සේවා සැපයීම අප අමාත්‍යාංශය ආරම්භ කරන බවත් ඔබ කාර්යාලද ඊට අනුගතව සේවා සැපයීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එච්.එම්.එම්.යූ.බී. හේරත්
ලේකම්
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
මධ්‍යම පළාත

පිටපත් : ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත - කා.දැ.ස.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ලියාපදිංචි අංකය :

| | |
|---|---|
| නම | |
| තනතුර | |
| පාසල | |
| කලාපය | |
| මහජන දිනයේ අමාත්‍යාංශයෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන සේවාව | |
| විදුහල්පතිගේ නිරීක්ෂණ හා නිර්දේශය (විදුහල්පති පෞද්ගලිකවම අත්සන් කළ යුතුය) | නිර්දේශය ( ස්ථාන මාරුවීමක් නම් අනුප්‍රාප්තිකයෙකු සහිතවද/ රහිතවද යන්න හා ඊට අදාල වෙනත් කරුණුද සඳහන් කළ යුතුය.)<br><br>අත්සන නිල මුද්‍රාව |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිරීක්ෂණ/නිර්දේශය | අදාල කාරණය පිළිබඳව නිරීක්ෂණ/නිර්දේශය<br><br>අත්සන නිල මුද්‍රාව |
| පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිරීක්ෂණ/නිර්දේශය ( අදාල වේ නම්) | අදාල කාරණය පිළිබඳව නිරීක්ෂණ/නිර්දේශය<br><br>අත්සන නිල මුද්‍රාව |